සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## නර්තනය

RICHMOND COLLEGE LIBRARY * GALLE *

**නම/විභාග අංකය :-** ..................................................................................... **කාලය : පැය 02 යි.**

### I කොටස

- 1 – 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. කමතේදී බැත එකතු කිරීම, බැත හුළං කිරීම වී පෙළීම ආදී කටයුතු නිරූපනය කෙරෙනුයේ.... නැටුමේදිය එය.

   1. කුළු  2. ගොයම් කැපීම  3. පන්නෙළීම  4. මෝල්ගස්

2. "සඳවට තරුවැල් ඇවිදින් කළ එලි සද්දේ..." මෙම කවිය,

   1. කුළු නැටුමේ කවියකි.
   2. ගොයම් කැපීමේ නැටුමකි.
   3. තාලම් නැටුමේ කවියකි.
   4. ලී කෙළි නැටුමේ කවියකි.

3. සෙලවීමෙන් හා පිඹීමෙන් හඬ උපදවා ගත හැකි විකල්පවාද්‍ය උපකරණයක් වන්නේ,

   1. මාර ඇට දැමූ ප්ලාස්ටික් බෝතලය, පැපොල් බටනලාව
   2. වතුර පුරවන ලද වීදුරු බෝතලය, පැපොල් බටනලාව
   3. ලීයක් සවිකළ පොල්කටු දෙකක්, බැලුම් බෝලය
   4. ගල් කැට දැමූ වීදුරු බෝතලය, ටොනික් පියන් වළල්ල

4. ළමා ලියෝ ගවසා මල් වරළ පිට ... යන කවිය ගායන කළ හැකි තාල රූපය වන්නේ,

   1. $\acute{1}$ 2 | $\acute{1}$ 2  2. $\acute{1}$ 2 3 | $\acute{1}$ 2 . 3  3. $\acute{1}$ 2 3 4 | $\acute{1}$ 2 3 4  4. $\acute{1}$ 2 | $\acute{1}$ 2 3

5. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන දවුලේ සම්මත දිග ප්‍රමාණය,

   1. අඟල් 18
   2. අඟල් 12
   3. අඟල් 10
   4. අඟල් 15 යි

6. දේශීය නර්තනයේ මූලික අංගහාරය......................... නමින් හැඳින්වේ.

   1. කෙන්ඩිය
   2. පංචාංගය
   3. මණ්ඩිය
   4. පදපහත්තිය

7. 1́ 2 | 1́ 2 3 යන තාල රූපය.................. නමින්ද හැඳින්වේ.

1. සුළු මැදුම් දෙතිත
2. සුළු මහ දෙතිත
3. මැදුම් මහ: දෙතිත
4. මහ තනිතිත

8. පහතරට නර්තන ශිල්පය ප්‍රගුණ කළ ආධුනිකයකු ඔහුගේ මුල් ම ශිල්ප දැක්වීමේ අවස්ථාව හඳුන්වන්නේ,

1. මඩු බැසීම
2. ගුරුවරම් දීම
3. කලඑළි මංගල්‍යය
4. හළං වැඩීම

9. රාමසාන් උත්සවයෙන් අවසන් කරනු ලබන උපවාස ශීලය, ආරම්භ කරනු ලබන්නේ,

1. අප්‍රේල් මාසයෙහි ය.
2. ජූනි මාසයෙහි ය.
3. ජූලි මාසයෙහි ය.
4. ජනවාරි මාසයෙහි ය.

10. ශාන්තිකර්ම සැරසිලි සඳහා බහුලව භාවිත කරනු ලබන්නේ,

1. ලී කෝටු, නාගවල්ලි කොළ
2. පොල්කොළ, අඹකොළ
3. ගොප් කොළ, කෙසෙල්බඩ
4. ඉරටු, ලී කෝටු

(ලකුණු 2 x 10 = 20)

- 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හරි නම් √ ලකුණ වැරදි නම් වැරදි x ලකුණ ඉදිරියෙන් ඇති වරහන් තුළ ලියන්න.

11. අල් කුරාණය මුස්ලිම් ජාතිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථයයි. ( )

12. පෙරහර සමය ආරම්භ වන්නේ බක්මාසයෙනි. ( )

13. කලඑළි මංගල්‍යයට පෙර නිර්මාංශ වීම චාරිත්‍රයකි. ( )

14. සුළු තනි තිතට අයත් මාත්‍රා සංඛ්‍යාව දෙකකි. ( )

15. සමූහ වාදනයකදී සම්ප්‍රදායික භාණ්ඩ පමණක් වාදනය කළ යුතු ය. ( )

A කොටසට වඩාත් ගැළපෙන පිළිතුර B කොටසින් සොයා ඊ තල මගින් යා කරන්න.

| A | | B |
|---|---|---|
| 16 | හත් අඩියේ පියුම | දවුල |
| 17 | පා සරඹ | පෙරහර |
| 18 | කඩිප්පුව | ගොප් කොළ |
| 19 | මොර, හිඹුටු දං පතා | දණ්ඩිකද |
| 20 | තූර්ය වාදනය | සුළු මැදුම් දෙතිත |

(ලකුණු 2 x 5=10)

## II කොටස

- ප්‍රශ්න 4 ක් පමණක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.

1. i. සුළු මැදුම් දෙතිතට අයත් බෙර පදයක් ලියන්න. (ලකුණු 3)
   ii. තුරඟා වන්නමේ කවියක් ලියන්න. (ලකුණු 5)
   iii. කුළු නැටුමකට අයත් කවියක පද දෙකක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 7)
   (මුළු ලකුණු 15)

2. i. දවුල වාදනය කරන අවස්ථා 3 ක් ලියන්න. (ලකුණු 3)
   ii. දවුල සෑදීමට යොදාගන්නා අමුද්‍රව්‍ය 5 නම් කරන්න. (ලකුණු 5)
   iii. දවුලෙහි රූප සටහනක් ඇඳ කොටස් 4 ක් නම් කරන්න. (ලකුණු 7)
   (මුළු ලකුණු 15)

3. i. දේශීය නර්තන සම්ප්‍රදායන්හි ශිල්ප හදාරා කළඑළි බසින අවස්ථාවේ සිදුකරන සුවිශේෂී චාරිත්‍ර 3ක් ලියන්න. (ලකුණු 3)
   ii. නර්තන කලාව හා සම්බන්ධ සාරධර්ම 2 ක් ලියන්න. (ලකුණු 5)
   iii. කලඑළි මංගල්‍යය / මඩු බැසීම / ගුරුවරම් දීම මින් එක් මාතෘකාවක් තෝරාගෙන කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 7)
   (මුළු ලකුණු 15)

4. i. රාමසාන් උත්සවය පවත්වන රටවල් 3 ක් නම් කරන්න. (ලකුණු 3)
   ii. මුස්ලිම් බැතිමතුන් උපවාස ශීලය රකින කාලයේදී පිළිපදින චාරිත්‍ර 2 ක් ලියන්න. (ලකුණු 5)
   iii. රාමසාන් උත්සවයේදී අනුගමනය කරන ක්‍රියාවන් විස්තර කරන්න. (ලකුණු 7)
   (මුළු ලකුණු 15)

5. i. පා සරඹ / මණ්ඩි පද නැටීමේ ඇති ප්‍රයෝජන 3 ක් ලියන්න. (ලකුණු 3)
   ii. ඔබ ඉගෙනගත් තුන්වන ගොඩ සරඹය / ඉලංගම් සරඹය / දොඹින පදය ලියා එහි කස්තිරම / ඉරට්ටිය / කලාසම ලියන්න. (ලකුණු 5)
   iii. පෙරහරක වාදනය කිරීමට සුදුසු බෙර පද 2 ක් ලියන්න. එක් සරඹ පදයක් ප්‍රස්ථාර සටහනක දක්වන්න. (ලකුණු 7)
   (මුළු ලකුණු 15)

6. i. මින් මාතෘකා 3 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   1. කළගෙඩි නැටුම
   2. ශාන්තිකර්ම සැරසිලි
   3. විකල්ප වාද්‍ය උපකරණ
   4. පෙරහර

   (ල. 5 බැගින් මුළු ලකුණු 15)